# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 85 — 1973 නොවැම්බර් 09 වැනි සිකුරාදා — 1973.11.09**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 1115 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | 1123 |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1118 | අය-වැය ලේඛන ... ... ... | 1126 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1121 | දේපළ විකිණීම ... ... ... | 1130 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 1122 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | 1131 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ගම් ප්‍රදේශයේ පිහිටි දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නැවත බෙදීමට අදාලව 1972 සැප්තැම්බර් 29 වැනි දින අංක 27 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය එහි 2 (අ) සහ 2 (ආ) ඡේදයෙහි "1973" යන ඉලක්කම් වෙනුවට "1974" යන ඉලක්කම ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු වැඩ බලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.
11–260/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමණ හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1973 ජනවාරි මස 7 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ රාස්සගල ගම් ප්‍රදේශයේ දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශ වලට බෙදීමට අදාලව 1972 සැප්තැම්බර් 29 වැනි දින අංක 27 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය එහි 2 (අ) සහ 2 (ආ) ඡේදයෙහි “1973” යන ඉලක්කම් වෙනුවට “1974” යන ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11–260/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගහපත්තු ගම් ප්‍රදේශයේ දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශ වලට බෙදීමට අදාලව 1972 සැප්තැම්බර් 29 වැනි දින අංක 27 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය එහි 2 (අ) සහ 2 (ආ) ඡේදයෙහි “1973” යන ඉලක්කම් වෙනුවට “1974” යන ඉලක්කම් ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු වැඩ බලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹදීය.

11–260/3—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය විලියම් නීල් ද අල්විස් වන මම මෙම නිවේදනයෙන් මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ අපරැක්ක බඹරැන්ද ගම් ප්‍රදේශයෙහි පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශ වලට නැවත බෙදා වෙන් කිරීමට අදාලව 1972 ඔක්තෝබර් 9 වෙනි දින අංක 28/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

(1) එහි 2(අ) සහ (ආ) ඡේදයෙහි “1973” යන ඉලක්කම් වෙනුවට “1974”' යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි වූ උපලේඛනයෙහි II වැනි තීරයේ —

(අ) අංක 13 දරණ ඡන්ද කොට්ඨාශයේ විස්තරය වෙනුවට පහත සඳහන් අළුත් විස්තරය ආදේශ කිරීමෙන් ;

ඡන්ද කොට්ඨාශ අංක 13 — බඹරැන්ද උතුර, බඹරැන්ද උතුර සහ කුරුඹුරේ යන ගම්වලින් සමන්විත වේ.

(ආ) අංක 14 දරණ ඡන්ද කොට්ඨාශයේ විස්තරය වෙනුවට පහත සඳහන් අළුත් විස්තරය ආදේශ කිරීමෙන් ;

ඡන්ද කොට්ඨාශ 14 — අකුරුබැබිල, අකුරුබැබිල ගමින් සමන්විත වේ.

(ඇ) අංක 15 දරණ ඡන්ද කොට්ඨාශයේ විස්තරය වෙනුවට පහත සඳහන් අළුත් විස්තරය ආදේශ කිරීමෙන් ;

ඡන්ද කොට්ඨාශ අංක 15 — බඹරැන්ද මධ්‍යම, අකුරුබැබිල නමින් හැඳින්වෙන ප්‍රදේශය හැර බඹරැන්ද මධ්‍යම ගමින් සමන්විත වේ.

(ඈ) අංක 17 දරණ ඡන්ද කොට්ඨාශයේ විස්තරය වෙනුවට පහත සඳහන් අළුත් විස්තරය ආදේශ කිරීමෙන් ;

ඡන්ද කොට්ඨාශ අංක 17 — මඩවල, මඩවල ගමින් සමන්විත වේ.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් 20 දින,
කොළඹ දී ය.

11–502—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### නගර සභා ආඥාපනත

1962 අංක 2 දරන පනතින් සංශෝධිත (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 10 (2) වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු වැඩබලන අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝගය.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

#### නියෝගය

මෙහි වූ උපලේඛනයේ සඳහන් එක් එක් නගර සභාවේ දැනට නිල දරන සභිකයින්ගේ නිල කාලය අවසන් විය යුතු දිනය වශයෙන් 1973 දෙසැම්බර් 31 වැනි දිනය වෙනුවට 1974 දෙසැම්බර් 31 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

#### උපලේඛනය

හොරණ නගර සභාව
කඩුගන්නාව නගර සභාව
හපුතලේ නගර සභාව
කොලොන්නාව නගර සභාව
වැලිගම නගර සභාව.

11–267/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### සුළු නගර සභා ආඥාපනත

1967 අංක 2 දරන පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 10 (2) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු වැඩබලන අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝගය.

නීල් ද අල්විස්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු වැඩබලන අමාත්‍ය.

1973 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

#### ආඥාව

මෙහි වූ උපලේඛනයේ සඳහන් එක් එක් සුළු නගර සභාවේ දැනට නිල දරන සභිකයින්ගේ නිල කාලය අවසන් විය යුතු දිනය වශයෙන් 1973 දෙසැම්බර් 31 වැනි දිනය වෙනුවට 1974 දෙසැම්බර් 31 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

#### උපලේඛනය

හෝමාගම සුළු නගර සභාව
කෙසෙල්වත්ත සුළු නගර සභාව
පුණ්ඩලුඔය සුළු නගර සභාව
වතුගෙදර සුළු නගර සභාව
අකුරැස්ස සුළු නගර සභාව
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

11–267/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

එල්.ජී.—බී. 22/53.

### විදුලි බල පනත

වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමතිතුමාගෙන් විමසා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් දෙන ලද අනුමැතිය ඇතිව කැලණිය සුළු නගර සභාව විසින් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වන අධිකාරය වන) විදුලි බල ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ සම්පාදිතවූ නියෝග.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ඔක්තෝබර් මස 29,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝගවල —

"පනත" යනුවෙන් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වැනි වගන්තිය යටතේ කැලණිය සුළු නගර සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස්, කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් කැලණිය සුළු නගර සභාව අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනකු විසින්—

(අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දින සිට යටත් පිරිසෙයින් දවස් දහ හතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රලායියා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි පිළියෙළ කල ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය; තවද

(ආ) විද්‍යුත් වේගවාහක කේබල් කම්බිය සඳහා ගාස්තු බල ධාරියා වෙත කලින් ගෙවීම හෝ බලපත්‍රලාභියා එසේ නියම කරන්නේ නම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමග ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීම කළ යුතුය.

3. (අ) බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කෙරෙන විදුලි බල සංස්ථාපන යක කම්බි ඇදීම පාරිභෝගිකයා විසින් කම්බි ඇදීම පිළිබඳව ඉංජිනේරු ආයතනය විසින් නියම කරනු ලැබූ නියෝගවලට අනුව කටයුතු කළ හැකි සෑම සමාගමකට හෝ පුද්ගලයකුට පැවරිය යුතුය. බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂාකොට අත්හදා බැලීමෙන් හා කම්බි ඇදීම පිළිබඳ ඉහත කී නියෝග අනුව ඒ කර්මාන්තය නිම කර ඇත්තේ යයි බලපත්‍රලාභියා සෑහීමට පත්වූවාට පසු පමණක් එබඳු සංස්ථාපනයකට විදුලි බලය සැපයිය හැකිය.

(ආ) සංස්ථාපනය එකී නියෝගවලට අනුකූල නොවන්නේ නම්, ඒ සංස්ථාපනය ඒ නියෝගවලට අනුකූලව සකස් කරනු ලබන තුරු ඒ ස්ථානයට විදුලි බලය නොදිය යුතුය.

4. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින් ම බලපත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණ අනුව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතු ය.

5. (අ) පාරිභෝගිකයාට අයත් භූමියෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි බල පරිවර්තක, ප්‍රධාන ගිනි නූල්, විද්‍යුත් මාපකය සහ විදුලි යතුරු පුවරු ද බලපත්‍රධාරියා සතු දේපළ වශයෙන් පැවතිය යුතු අතර, බලපත්‍රලාභියාගේ බලය පවරනු ලැබූ සේවකයකු විසින් හැර වෙන යම් කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහාවත් ඒවා වෙනස් කිරීම හෝ අතපත ගෑම හෝ නොකළ යුතුය.

(ආ) බලපත්‍රලාභියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ සිට ස්වකීය පාර්ශ්වයේ ඇත්තාවූ කම්බි, කේබල් කම්බි හා උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වගකිව යුතුය.

(ඇ) ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේ දී එය සෝදිසි කර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයෙහි විධි විධාන සලසා ඇති පරිදි උචිත ගාස්තුවක් අය කළ යුතු අතර පාරිභෝගිකයා විසින් එම ගාස්තුව කලින් ගෙවිය යුතුය.

(ඈ) යම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ උපකරණවල යම් කොටසකින් විදුලි බලය කාන්දුවීමක් සිදු වුවහොත් ස්වකීය ස්ථානයේ පාවිච්චි වූ ලෙස මාපකයේ සටහන් වූ සියලුම විදුලි බලය සඳහා පාරිභෝගිකයා විසින් විදුලිබල පනතේ 41 වන වගන්තියට අනුව මුදල් ගෙවීමට බැඳී සිටිය යුතුය.

6. (අ) තමාට විදුලි බලය සැපයූවාට පසු යම් විටෙක තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් යම් ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම් ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙනයම් උපකරණයක් සවි කිරීමට හෝ තමාගේ දේපොලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරන සෑම පාරිභෝගිකයෙකු විසින්ම, එබඳු දික්කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් මත්තෙන් එබඳු යම් වෙනස් කිරීමක් හෝ දික් කිරීමක් පිළිබඳව බලපත්‍රලාභියා වෙත දැනුම් දිය යුතුය.

(ආ) කිසිම පාරිභෝගිකයකු විසින් තාවකාලිකව හෝ ස්ථිර වශයෙන්, යම් දීර්ඝ කිරීමක්, ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයකට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීම හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන උපකරණයක් විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියකට සවි කිරීම, ඒ දීර්ඝ කිරීම, ලාම්පුව, පංකාව, මෝටරය, වැඩිපුර ලාම්පු හෝ වෙනත් උපකරණ බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධරයකු විසින් පරීක්ෂා කොට අත්හදා බලා සතුටු දායක යයි ඒත්තු ගතහොත් මිස, සවි නොකළ යුතුය.

7. (අ) යම් ස්ථානයක බලපත්‍රලාභියාගේ ගිනි නූල උණුවී ගියහොත්, පාරිභෝගිකයා විසින් අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලාභියාගේ විදුලි බලස්ථානය හෝ උප බලස්ථානය භාර නිලධාරියා වෙත ඒ බව වහාම දැනුම් දිය යුතුය.

(ආ) බලධාරියා විසින් බලය දෙන ලද නිලධරයකුගෙන් හෝ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා සිටින කම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින් බලපත්‍රලාභියාගේ දේපලවන උණුවී ගිය ගිනි නූල වෙනුවට වෙනින් ගිනි නූලක් දැමීම නොකළ යුතුය.

(ඇ) පාරිභෝගිකයාගේ හෝ බලපත්‍රලාභියාගේ හෝ දේපල වන යම් ගිනි නූලක් වෙනුවට වෙනකක් දැමීමට බලපත්‍රලාභියාගේ යම් නිලධරයකුගේ හෝ කම්කරුවකුගේ හෝ සේවය වුවමනා කරන්නේ නම්, ඒ සඳහා ගෙවිය යුතු බලපත්‍රයේ සඳහන් උචිත ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

8. විදුලිබලය සැපයීමේදී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ සිදුවන බාධා හේතුකොට ගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ අලාභහානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා පාරිභෝගිකයාට වගකීමට බැඳී නොසිටී.

9. ආඥාපනතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුණා වූ විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කරන කල්හි එය අත්හදා බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ගාස්තුවක් අය කළ යුතුවාත් හැර, එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

10. (අ) සියලුම අය කිරීම්, ගණනක් ඉදිරිපත් කරනු ලැබූ දිනයට අය විය යුතුව තිබෙන්නාසේ සැලකිය යුතුය.

(ආ) යම් ගණනක් පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කොට සතියක් ඇතුළත දී කරන ලද්දේ නම් මිස ගණනක හරි වැරදි පිළිබඳ වූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රලාභියා විසින් භාර නොගත යුතුය.

11. (අ) ස්වකීය ස්ථානයට විදුලි බලය අනවශ්‍ය සෑම පාරිභෝගිකයකු විසින්ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

(ආ) (අ) ඡේදයේ සඳහන් දැනුම් දීම කර නොමැති කල්හි, විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රලාභියා දැන්වීම් ලබන දින සිට දවස් තුනක් ගතවනතුරු ඒ ස්ථානයේ බලපත්‍රලාභියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිව යුතු අතර, ඒ ස්ථානයේ පාවිච්චි කරන්ට යෙදුන සියලුම විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තු ගෙවීමටද පාරිභෝගිකයා යටත් විය යුතුය. එසේ වුවද එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රලාභියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම්, සේවය අසම්බන්ධ කරනු ලබන තාක් ඒ ස්ථානයේ පාවිච්චි වන විදුලි බලය සම්බන්ධයෙන් පමණක් ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා යටත් විය යුතු ය.

12. යෝජිත කර්මාන්ත බලපත්‍රලාභියාගේ නිලධරයකු විසින් පරීක්ෂා කර බැලීමට හැකි වන පරිදි ඒ පිළිබඳ දවස් දෙකකට නොඅඩු දින ගණනකට කලින් දැනුම් දීමෙන් පසුව මිස, දැනට පවත්නා විදුලි බල සංස්ථාපනයක එක් කිරීම්, වෙනස් කිරීම් හෝ සකස් කිරීම් ඇතුළුව විදුලිබල සංස්ථාපන කර්මාන්ත වැනි කිසිදු විදුලි කර්මාන්තයක් ආරම්භ නොකළ යුතුය.

13. බලපත්‍රලාභියා වෙත දැන්වීමක් නොකරනු ලැබ හා ඔහුගේ අනුමැතිය කලින් ලබා නොගෙන යම් ස්ථානයක අලුත් විදුලි බල සංස්ථාපනයක් සම්බන්ධයෙන් වූ යම් විදුලි කර්මාන්තයක් කර ගෙන යන්නේ නම්, බලපත්‍රලාභියා වෙත විධිමත් දැනුම්දීමක් ලැබෙන තුරු හා අවශ්‍ය අත්හදා බැලීම් කරන තුරු බලපත්‍රලාභියා විසින් එකී විදුලි කර්මාන්තය කරගෙන යන ලද ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂේප කරන හැකිය.

14. බලපත්‍රලාභියාට කලින් දැන්වීමක් නොකර හා ඔහුගේ අවසරය ලබා නොගෙන බලපත්‍රලාභියාගේ විද්යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකර ඇත්තා වූ විදුලි බල සංස්ථාපනයක යම් දීර්ඝ කිරීමක් කරගෙන යනු ලබන විට සම්පූර්ණ විදුලි බල සංස්ථාපනයම සවි කිරීම බලපත්‍රලාභියාගේ විද්යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් අසම්බන්ධ කරනු ලැබීමට යටත් විය යුතු ය.

15. යම් විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රලාභියා විසින් ඒ සඳහා සපයනු ලැබිය හැකි ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතු අතර, විදුලි බලය අවශ්‍ය වීමට පැය හතළිස් අටකට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රලාභියාගේ කාර්යාලය වෙත භාර දිය යුතු ය.

11-426—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

**265 වන අධිකාරය වන පළාත් පාලන (සේවා ප්‍රදේශ) ආඥාපනත**

පහත සඳහන් පත්වීම කර ඇති බැව් නිවේදනය කරනු ලැබේ:—

මහනුවර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලංකා පරිපාලන සේවයේ 2 වැනි පන්තියේ එම්. බී. සමරකෝන් මහතා සිය රාජකාරිවලට අතිරේකව 1973 සැප්තැම්බර් මස 17 වැනි දින සිට, ලංකා පරිපාලන සේවයේ කේ. ජී. ඩී. විමලසිරි මෙනෙවිය නැවත රාජකාරි භාරගන්නා තුරු මාතලේ ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

බී. රාජේන්ද්‍ර,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1973 ඔක්තෝබර් මස 12 වන දින,
කොළඹ දී ය.

11-501—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනතේ 13 වෙනි වගන්තිය යටතේ දැනුම්දීමයි**

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වෙනි අධිකාරිය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර ත්‍රිකුණාමලයේ පළාත් පාලන සහකාර කොමසාරිස් බර්ට්‍රම් ආර්නෝල්ඩ් ජයරාජා කාසිනාදර් වන මම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාම්බල්තිවු ගම් සභාවේ අංක 1 කොට්ඨාසයේ නියෝජිත සෝතිලිංගම් රාජේන්ද්‍රම් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි වාර ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසුව නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාම්බල්තිවු ගම් සභාවේ අංක 1 කොට්ඨාසයේ නියෝජිත සෝතිලිංගම් රාජේන්ද්‍රම් මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභිකත්වය අහෝසි වූ බව මෙයින් ප්‍රකාශ කරමි.

බී. ඒ. ජේ. කාසිනාදර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය.

පළාත් පාලන දෙපාර්තමේන්තුව,
ත්‍රිකුණාමලය,
1973 නොවැම්බර් මස 22 දින දී ය.

11-299—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ නානුඔය ගම්සභාවේ ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ නිල කමිටුව

1. (අ) සභිකයකු නියෝජනය කරන එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතාක් දුරට සමාන වන සේ ප්‍රදේශයේ විශාලත්වය, ජනගහනය හා වෙනත් හේතුසාධක සලකා බලා ඉහත ගම්සභාවේ ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම සහ

(ආ) ගම්සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර සම්බන්ධ කරුණු ගැන පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා, පහත සඳහන් නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර තිබේ:—

(1) නුවරඑළිය පළාත් පාලන සහකාර කොමසාරිස්, න. බබරවානගේ මහතා (සභාපති),

(2) නුවරඑළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරී, අභය කපුආරච්චි මහතා,

(3) නුවරඑළිය සහකාර මැනුම් අධිකාරී, ඒ. එල්. එස්. කොඩේවත්ත මහතා.

2. මෙම කරුණ සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන මහජනයා හෝ ආයතන හෝ ඇතොත්, ඔවුන් තම අදහස් පිටපත් තුනකින් යුත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 1973 නොවැම්බර් මස 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි එවන මෙන් දන්වා සිටිමි.

න. බබරවානගේ,
පරීක්ෂණ කමිටුවේ සභාපති සහ
නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් පාලන
සහකාර කොමසාරිස්.

1973 ඔක්තෝබර් මස 22 දින,
නුවරඑළිය,
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

11-247—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙ IV වැනි කොටසේ පළකෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—සම්මත වූ කලි 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි.

3. **විශ්‍රාම වැටුප් පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6 ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිලධාරීතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9 ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—.

අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—.

| | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ආ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ):—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමත්ව වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ආ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ?

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, කරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක් ද ?

16. වෙනත් විස්තර (විශේෂහිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා, නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරු ගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැපෙ. 530, කොළඹ 1.

---

යාපනය නාගරික සභාව

I වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. තෝරාගනු ලබන තැනැත්තා මාරු කර යැවීමට යටත් වන අතර, ඔහු ප්‍රාදේශීය බලමණ්ඩලයේ සීමාව ඇතුළත පදිංචි විය යුතුය.

3. වැටුප.—තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 6,600—8 × 180—5 × 240—රු. 9,240 ක් වේ. එහි රු. 7,320 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ද ඇත. මීට අමතරව රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ. (පුස්තකාල විද්‍යාව පිළිබඳව පිළිගත හැකි ඩිප්ලෝමා සහතිකයක් දරණ තැනැත්තෙකුට වර්ෂයකට රු. 360 ගණනේ 4 වරක් වැඩිවී වර්ෂයකදී රු. 10,680 දක්වා උපරිම වැටුපක් ලැබීමට හිමිකම් ඇත්තේ ය.)

4. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස.—73.12.15 දිනට වයස අවුරුදු 40 ට නොවැඩිවිය යුතුයි. (පළාත් පාලන සේවයේ සාමාජිකයින්ට මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.)

(ආ) අධ්‍යාපනය.—අයදුම්කරුවන් දෙමළ විෂයයෙන් සාමාර්ථයක් සමග පිළිගත හැකි විශ්ව විද්‍යාලයක උපාධිධරයන් විය යුතු අතර, ඔවුන්ට පුස්තකාලයක පරිපාලන පළපුරුද්දක් තිබිය යුතුය. පුස්තකාල වැඩ පිළිබඳ අභ්‍යාස පුහුණුවක් හා පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍රය, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 73.12.15 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයේ 13 වැනි අංකය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුයි.

"13. (අ) පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද,

(සේවය කරන ලද ස්ථාන හා කාල සීමාවන් ඇතුළු විස්තර සහිතව).

(ආ) පුස්තකාල වැඩ සම්බන්ධව අභ්‍යාස පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර."

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිතුමා වෙත හෝ ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු දක්වමින් ඒ අයදුම්පත්‍ර භාර ගන්නා ලෙස ඔවුන් විසින් නිර්දේශ කරනු ලැබුව හොත් මිස, සලකා බලනු නොලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ඔක්තෝබර් 29 වන දින,
තැ. පෙ. 530,
කොළඹ.

11–281—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිපල ආදිය

## පළාත් පාලන සේවයේ I, II හා III ශ්‍රේණිවල කර්මාන්ත/ජල කර්මාන්ත අධිකාරීගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය

පහත නම සඳහන් කර ඇති නිලධාරියා පළාත් පාලන සේවයේ II වැනි ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ඇති බව මෙයින් දන්වමි.

ආර්. සී. අබේසේකර මහතා — මහනුවර නගර සභාව.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 23 දින,
තැ. පෙ. 530, කොළඹ.

11–498—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ, මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැද පළාත ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සාදන ලදුව, ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.10. 27 වැනි දින
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

### කශල ශෝධනය

කශල ශෝධනය පිළිබඳව සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල vi වැනි කොටසේ 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කශල ශෝධනය වෙනුවෙන් සභාවට මාසයක් පාසා ගෙවිය යුතු ගාස්තුව එක් එක් ස්ථානයකින් රුපියල් එකක් විය යුතුය.

11-450—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

### අලව්ව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපණතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ අලව්ව සුළු නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපණතේ 153 වන වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.10.27 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. (i) මෙ අතුරු ව්‍යවස්ථා 1973 අලව්ව පොල අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැක.

(ii) අලව්ව පොල නමින් හඳුන්වනු ලැබීමට නියමිත හා එසේ හැඳින්වෙන පොලක් සෑම අඟහරුවාද හා සිකුරාද දිනයන්හිදී හෝ සභාව විසින් නියම කරන වෙනත් යම් දිනකදී සභාව විසින් පැවැත්විය යුතුය.

2. (i) සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන්නෙකු හෝ එලෙස අවසර පත්‍රයක් දරන්නෙකුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු හැර වෙනත් කිසිම තැනැත්තෙකු විසින් පොල පිහිටි භූමිය ඇතුළත කිසියම් වෙළඳ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකල යුතුය.

(ii) (i) වන ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි වූ 1 වැනි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර නිකුත් කරන දිනයට පමණක් වලංගු විය යුතුය.

3. පොල පිහිටි භූමිය ඇතුලත වූ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන සෑම තැනැත්තෙකු විසින්ම මෙහි වූ 2 වැනි උප ලේඛණයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාන අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

4. 3 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තු එකතුකර ගැනීමට සභාව නිලධාරියෙකු නොයොදවන්නේ නම් ගාස්තු එකතු කර ගැනීමෙ අයිතිය ටෙන්ඩර් කැඳවීමෙන් අනුමත කරන ලද තැනැත්තෙකුට බදු දිය හැකිය.

5. (i) 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තෙකු විසින් පොල පිහිටි භූමිය ඇතුලත යම් මස් වර්ගයක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම නොකල යුතුය.

එසේ වුවද, එවැනි භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීමට සභාපති විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන විශේෂ අවසර පත්‍රයක් මගින් ලබන බලය යටතේ එසේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම කල හැකිය.

(ii) එවැනි අවසර පත්‍රයක් නිකුත් කිරීමට සුදුසුවූ ද, ප්‍රමාණවත්වූ ද හේතු ඇතැයි සභාපති සෑහීමකට පත් වුවහොත් මිස එබඳු විශේෂ අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

6. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලය ලත් සේවකයින් අතර හෝ ඔවුන් සහ මහජනයා අතර වෙළඳ පොල පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇතිවන කිසියම් ආරාවුලක් සභාපති විසින් බලය පවරනු ලැබූ රාජකාරියෙහි යෙදී සිටින කිසියම් නිලධාරියෙකු විසින් පොල පිහිටි භූමිය තුලදී නිරවුල් කල හැකිය.

7. පොල පිහිටි භූමිය තුල සාමය පවත්වා ගැනීම, එම කාර්ය සඳහා සභාව විසින් පත් කරනු ලබන සහ පොල පිහිටි භූමිය තුල රාජකාරියෙහි යෙදී සිටින නිලධාරියෙකු විසින් කල යුතුය.

8. බඩු මිලදී ගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොලට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින්ම සභාවේ නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් ආරාවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා දෙනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදිය යුතුය.

9. කිසියම් තැනැත්තෙකු පොල පිහිටි භූමිය ඇතුලත—

(අ) යම් පිසිමක් කරගෙන යාම, හෝ

(ආ) අවිනීත අන්දමින් හැසිරීම හෝ කිසියම් ශබ්දයක් හෝ කරදරයක් කිරීම හෝ වෙනත් යම් තැනැත්තෙකු සමග දබර කර ගැනීම හෝ අපහාසාත්මක නින්ද සහගත හෝ අවිනීත වචන පාවිච්චි කිරීම, හෝ

(ඇ) සභාවේ නිලධාරියෙකු විසින් හෝ ග්‍රාමසේවක හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපති ගේ බලය යටතේ කටයුතු කරන යම් තැනැත්තෙකු විසින් හෝ ඉවත්ව යන ලෙස නියම කරනු ලැබීමෙන් අනතුරුවත් තව දුරටත් රැඳී සිටීමට සෑහෙන හේතු නොපෙන්වා රැඳී සිටීම හෝ සූනාංගු වීම, හෝ

(ඉ) සූදු ක්‍රීඩාවේ යෙදීම හෝ නොකල යුතුය.

10. (i) පොල පිහිටි භූමිය ඇතුලත විකිණීම සඳහා ප්‍රදර්ශණය කොට ඇති යම් ආහාර වර්ගයක් ආහාර පිණිස යෝග්‍ය නොවන බව තමාට පෙනී ගියහොත් සභාපති විසින් හෝ වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන යම් සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

(ii) (i) වැනි ඡේදය යටතේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් ආහාරයට නුසුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබුවහොත් ඒ ද්‍රව්‍ය තහනම් කිරීමේ දී එය අයිතිව තිබූ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කල හැකිය.

11. (i) සභාපති විසින් වෙළඳ පොල පරිපාලනය කරනු වස් පත් කරන ලද යම් නිලධාරියෙකු හෝ තැනැත්තෙකු රාජකාරියේ යෙදී සිටියදී කිසිම තැනැත්තෙකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකල යුතුය.

(ii) කුලී ගාස්තු අයකරගනු වස් සභාව විසින් හෝ (කුලී ගාස්තු එකතු කිරීමේ අයිතිය බදු දී ඇති අවස්ථාවක නම්) බදු හිමියා විසින් හෝ පත් කරනු ලබන කිසියම් තැනැත්තෙකු රාජකාරියේ යෙදී සිටියදී යම් තැනැත්තෙකු ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකල යුතුය.

12. කිසියම් තැනැත්තෙකු විසින්—

(අ) පොල පැවැත්වෙන දිනයට පූර්ව දිනයෙහි ප.ව. 3 ට පෙර පොල පිහිටි භූමිය ඇතුලත යම් මඩු හෝ පියස්ස සහිත ආකෘති ඉදි කිරීම හෝ පැදුරු හෝ ගෝනි තැබීම හෝ

(ආ) පොල පැවැත්වෙන දිනයට පසු දින පෙරවරු 9 න් පසුව පොල පිහිටි භූමිය තුල යම් මඩු හෝ පියසි සහිත ආකෘති-හෝ පැදුරු හෝ ගෝනි හෝ වෙන යම් ද්‍රව්‍යයක් තැබීම නොකල යුතුය.

13. පොල පැවැත්වෙන දිනයට පසු දිනයෙහි පෙරවරු 9.00 ට පසුව පොල පිහිටි භූමිය ඇතුලත වූ ඉවත් නොකොට තබා ඇති යම් මඩු, පියස්ස සහිත ආකෘති, පැදුරු ,ගෝනි හෝ වෙන යම් ද්‍රව්‍යයක් සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ ක්‍රියාකරන සභාවේ වෙනයම් නිලධාරියෙකු විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

14. මෙ අතුරු ව්‍යවස්ථා අතුරෙන් කිසිවක් උල්ලංඝනය කරනු ලැබුව හොත් රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කල හැකි විය යුතු අතර නිසි අධිකරණ බලය ඇති උසාවියකින් වැරදි කරු බව ඔප්පු කරනු

ලැබීමෙන් අනතුරුව හෝ සභාපති විසින් හෝ සභාපති විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් එකී උල්ලංඝනය කිරීම ගැන අවධානය යොමු කරමින් ලිඛිත නිවේදනයක් භාර දෙනු ලැබීමෙන් අනතුරුව උල්ලංඝනය කිරීම අඛණ්ඩව කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන් රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකින් ද දඬුවම් කල හැකි විය යුතුය.

1 වන උපලේඛනය

අලව්ව සුළු නගර සභාව—අලව්ව පොල

දිනය :.....................

........................................................................ මහතා/මහත්මියගෙන්

රුපියල් ......... සත ...... ක් ලදිමි.

| | | රු. ශ. |
|---|---|---|
| 1. කඩකාමර/බිම් කොටස අංක | ... | ... |
| 2. බුලත්/මාලු පොල්/කැඹිලි/කුරුම්බා | ... | ... |
| 3. කෙසෙලකැන්/පුවක් ... | ... | ... |
| 4. වාහන (කරත්ත, ලොරි ආදිය) | ... | ... |
| 5. වෙනත් ද්‍රව්‍ය ... | ... | ... |
| | එකතුව | ... |

.........................

කුලි ගාස්තු එකතු කරන්නාගේ අත්සන.

2 වැනි උපලේඛණය

| | | | රු. ශ. |
|---|---|---|---|
| 1. | වර්ග අඩි 50 ට වැඩි කඩ කාමරයක් සඳහා | ... | 1 50 |
| 2. | වර්ග අඩි 50 ට අඩු වන කඩ කාමරයක් සඳහා | ... | 1 0 |
| 3. | වර්ග අඩි 50 ට වැඩි වූ බිම් කොටසක් සඳහා | ... | 0 75 |
| 4. | වර්ග අඩි 50 ට අඩු වූ බිම් කොටසක් සඳහා | ... | 0 50 |
| 5. | බුලත් 1,000 ක් හෝ ඉන් කොටසකට | ... | 0 10 |
| 6. | 20 කට වඩා වූ කෙසෙල්කැන් තොගයක් සඳහා එක් කෙසෙල්කැනකට ... | ... | 0 05 |
| 7. | 20 කට වඩා වූ කෙසෙල්කැන් තොගයක් සඳහා එක් කෙසෙල්කැනකට ... | ... | 0 04 |
| 8. | සෑම කජු ගෙඩි 1,000 කට හෝ ඉන් කොටසකට | ... | 0 20 |
| 9. | මාලු පොල්, කැඹිලි හෝ කුරුම්බා (සෑම ගෙඩි 100 කට) | | 0 50 |
| 10. | ගෙඩි 1,000 බැගින් වූ සෑම පුවක් තොගයකටම | ... | 0 50 |
| 11. | ගෙඩි 100 බැගින් වූ අන්නාසි ගෙඩි තොගයකටම | ... | 1 0 |
| 12. | පළතුරු හෝ වෙනත් ද්‍රව්‍යයක් සඳහා සෑම ගෙඩි 100 කට හෝ එක් ගෝනියක්/මල්ලක් වෙනුවෙන් | ... | 0 25 |

11-449—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## වැලිමඩ සුළු නගර සභාව

### 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

වගකීම් :

| | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| මිශ්‍ර තැන්පත් ... ... | | | 96,149 69 |
| ණය මුදල් ... ... | | | 3,903 37 |
| ක්ෂය සංචිතය ... ... | | | 22,500 0 |
| **රජයේ ආධාර මුදල් :** | | | |
| ලන්දේගම ඇල පාර ... ... | | 46 50 | |
| විද්‍යාල පාර ... ... | | 2,788 18 | |
| නිවාස යෝජනා ක්‍රමය ... ... | | 38,795 25 | |
| විද්‍යාල පාර ... ... | | 89 10 | |
| පාරවල් (ලන්දේගම ඇලපාර) ... | | 48 75 | |
| පාරවල් (ලන්දේගම ඇලපාර) ... | | 402 19 | |
| පැතිකාණු ... ... | | 269 10 | |
| | රු. ශ. | | 42,439 07 |
| විවිධ ණය හිමියෝ ... ... | | | 48,095 85 |
| 1971.12.01 දිනට අධිකය (සාමාන්‍ය) ... | | 89,085 24 | |
| 1971.12.31 දිනට ආදායම | 49,677 20 | | |
| 1971.12.31 දිනට වියදම ... | 21,398 59 | | |
| | | 28,278 61 | |
| 1971.12.31 දිනට අධිකය ... | | | 1,17,363 85 |
| 1971.12.01 දිනට අධිකය (විදුලිය අංශය) ... | | 2,00,966 0 | |
| 1971.12.31 දිනට වියදම ... | 42,666 23 | | |
| 1971.12.31 දිනට ආදායම | 24,153 08 | | |
| | | 18,513 15 | |
| 1971.12.31 දිනට අධිකය ... | | | 1,82,452 85 |
| | | | 5,12,904 68 |

වත්කම් :

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් ... ... | | 20,985 79 |
| ස්ථිර තැන්පත් ... ... | | 2,52,000 0 |
| **ආදායම් රැස්කිරීමේ ගිණුම් :** | | |
| දේපොල බදු ... ... | 10,200 28 | |
| ජලබදු ... ... | 5,505 13 | |
| වැසිකිලි බදු ... ... | 5,428 39 | |
| කුලී ... ... | 11,550 43 | |
| වැසිකිලි ගාස්තු ... ... | 499 0 | |
| විදුලිබල ගාස්තු ... ... | 65,611 34 | |
| විවිධ ණය ගැතියෝ ... ... | 47,509 97 | |
| වරෙන්තු ගාස්තු ... ... | 1,564 38 | |
| | | 1,47,868 92 |
| 1971.12.31 දිනට මුදල් පොතේ ශේෂය ... | | 92,049 97 |
| | | 5,12,904 68 |

වැලිමඩ සුළු නගර සභාවේ සභාපති තැන වූ වැල්හේනගේ අමරියස් සිල්වා වන මම, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට ඉහත දක්වා ඇත්තේ 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට වැලිමඩ සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. ඒ. සිල්වා,
සභාපති,
වැලිමඩ සුළු නගර සභාව.

1972 අප්‍රේල් මස 3 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

ආර්. ඇම්. මුතුබණ්ඩා,
අංක 1 දරණ කොටසේ සුළු නගර සභික.

1972 අප්‍රේල් මස 3 වැනි දින මා ඉදිරියේ සහතික කරන ලදී.

ඒ. ජී. දිවිකොටවෙල,
සමාදාන විනිශ්චයකාර තැන.

### වැලිමඩ සුළු නගර සභාව

### 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට ආදායම් හා වියදම් ප්‍රකාශය

**ආදායම් :**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම | 92,984 41 |
| බී.—මංමාවත් | — |
| සී.—සභාවට අයත් ගොඩනැගිලි හා ඉඩම් | 811 50 |
| ඩී.—මහජන සනීපාරක්ෂාව | 43,933 72 |
| ඊ.—මහජන සාදයෝ | 9,133 25 |
| එෆ්.—සුසාන භූමි | — |
| ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම | 6 00 |
| එච්.—කිරුම් හා මිනුම් | — |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම | — |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල | 651 43 |
| **වෙනත් ආදායම් :** | |
| තැන්පත් | 35,889 33 |
| අත්තිකාරම් | 25,456 17 |
| රජයේ ආධාර මුදල් | — |
| ණය | — |
| විදුලිබල ගිණුම | 1,45,445 53 |
| ස්ථිර තැන්පත් | 27,000 00 |
| ක්ෂය සංචිතය | 2,500 00 |
| අධිකතා ඌනතා ගිණුම—සාමාන්‍ය | 10 05 |
| **ආදායම් රැස්කිරීමේ ගිණුම් :** | |
| දේපොල බදු | 7,104 69 |
| ජල බදු | 3,449 67 |
| වැසිකිළි බදු | 3,438 80 |
| කුලී | 9,698 00 |
| වැසිකිළි ගාස්තු | 830 00 |
| වරෙන්තු ගාස්තු | 209 75 |
| විදුලි ගාස්තු | 1,24,961 61 |
| විවිධ ණය ගැතියෝ | 25,444 90 |
| විවිධ ණය හිමියෝ | 46,240 51 |
| 1970.12.31 දිනට මුදල් පොතේ ශේෂය | 64,712 01 |
| | 6,69,911 33 |

**වියදම් :**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් | 49,501 23 |
| බී.—මංමාවත් | 9,495 87 |
| සී.—සභාවට අයත් ගොඩනැගිලි හා ඉඩම් | 6,154 98 |
| ඩී.—මහජන සනීපාරක්ෂාව | 69,415 68 |
| ඊ.—මහජන සාදයෝ | 671 00 |
| එෆ්.—සුසාන භූමි | — |
| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම | — |
| එච්.—කිරුම් හා මිණුම් | — |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම | — |
| ජේ.—කියවීම් හා පුස්තකාල | 1,856 40 |
| **වෙනත් ආදායම් :** | |
| තැන්පත් | 8,132 80 |
| අත්තිකාරම් | 26,358 04 |
| රජයේ ආධාර මුදල් | 5,235 00 |
| ණය | — |
| විදුලිබල ගිණුම | 1,23,287 92 |
| ස්ථිර තැන්පත් | 50,000 00 |
| ක්ෂය සංචිතය | — |
| අධිකතා ඌනතා ගිණුම—සාමාන්‍ය | 792 96 |
| **ආදායම් රැස්කිරීමේ ගිණුම් :** | |
| දේපොල බදු | 7,626 29 |
| ජලබදු | 3,727 59 |
| වැසිකිළි බදු | 3,718 72 |
| කුලි | 10,646 00 |
| වැසිකිළි ගාස්තු | 876 00 |
| වරෙන්තු ගාස්තු | 1,208 30 |
| විදුලි ගාස්තු | 1,28,225 93 |
| විවිධ ණය ගැතියෝ | 34,427 66 |
| විවිධ ණය හිමියෝ | 36,502 99 |
| 1971.12.31 දිනට මුදල් පොතේ ශේෂය | 92,049 97 |
| | 6,69,911 33 |

වැලිමඩ සුළු නගර සභාවේ සභාපති වැල්හේනගේ අමරියස් සිල්වා වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට වැලිමඩ සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳව නිවැරදිවූත් සත්‍යවූත් ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. ඒ. සිල්වා,
සභාපති,
වැලිමඩ සුළු නගර සභාව.

1972 මාර්තු මස 29 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

1972 අප්‍රේල් මස 3 වැනි දින මා ඉදිරියේ වැලිමඩදී සහතික කරන ලදී.

ඒ. ජී. දිවිතොටවෙල,
සමාදාන විනිශ්චයකාර තැන.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

ආර්. ඇම්. මුතුබණ්ඩා,
අංක 1 කොට්ඨාශයේ සුළු නගර සභික.

11–306/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### වැලිමඩ සුළු නගර සභාව

### 1972 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

**බැරකම් :**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| මිශ්‍ර තැන්පත් | | 1,24,414 92 |
| රජයේ ආධාර | | 51,933 57 |
| ණය මුදල් | | 3,903 37 |
| ක්ෂය සංචිතය | | 25,000 00 |
| විවිධ ණය හිමියෝ | | 38,513 17 |
| අධිකතා ඌණතා ගිණුම—(සාමාන්‍ය අංශය) : | | |
| 1972.01.01 දිනට අධිකය | 1,17,363 85 | |
| 1972.12.31 දිනට ආදායම | 1,51,317 06 | |
| | 2,68,680 91 | |
| 1972.12.31 දිනට වියදම | 1,41,789 28 | |
| | 1,26,891 63 | |
| සකස්කිරීම් බැර | 1,268 84 | |
| | 1,28,160 47 | |
| සකස්කිරීම් හර | 95 91 | |
| | | 1,28,064 56 |

**වත්කම් :**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් | | 44,349 82 |
| ස්ථිර තැන්පත් | | 2,00,000 0 |
| ආදායම් රැස්කිරීමේ ගිණුම් : | | |
| දේපොල බදු | 9,726 54 | |
| ජල බදු | 5,389 61 | |
| වැසිකිළි බදු | 5,318 37 | |
| කුලී | 4,105 24 | |
| වැසිකිළි ගාස්තු | 671 00 | |
| විදුලි ගාස්තු | 56,616 71 | |
| විවිධ ණය ගැතියෝ | 42,004 23 | |
| වරෙන්තු ගාස්තු | 1,156 55 | |
| | | 1,24,988 25 |
| 1972.12.31 වැනි දිනට මුදල් පොතේ ශේෂය | | 2,19,598 70 |

| | රු. ශ. | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|---|
| අධිකතා ඌනතා ගිණුම—(විදුලිය අංශය) : | | | | |
| 1972.01.01 දිනට අධිකය ... | 1,82,452 85 | | | |
| 1972.12.31 දිනට ආදායම ... | 1,60,163 95 | | | |
| | 3,42,616 80 | | | |
| 1972.12.31 දිනට වියදම ... | 1,39,074 80 | | | |
| | 2,03,542 0 | | | |
| සකස් කිරීම් බැර ... ... | 13,565 18 | | | |
| | | 2,17,107 18 | | |
| | | 5,88,936 77 | | 5,88,936 77 |

වැලිමඩ සුළු නගර සභාවේ සභාපති තැනවූ, වැල්හේනගේ අමරියස් සිල්වා වන මම, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට ඉහත දක්වා ඇත්තේ 1972 දෙසැම්බර් මස 31 වැනි දිනට වැලිමඩ සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ සත්‍යවූත් නිවැරදිවූත් ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. ඒ. සිල්වා,
සභාපති,
වැලිමඩ සුළු නගර සභාව.

1973 මාර්තු මස 28 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

1973 මාර්තු මස 28 වැනි දින මා ඉදිරියේ වැලිමඩදී සහතික කරන ලදී.
ගෝ. පී. ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාර තැන, වැලිමඩ.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.
ආර්. ඇම්. මුතුබණ්ඩා,
අංක 1 දරණ කොට්ඨාශයේ සභික.

## වැලිමඩ සුළු නගර සභාව

### 1972 දෙසැම්බර් මස 31 වැනි දිනට ආදායම් හා වියදම් ප්‍රකාශය

| | රු. ශ. | රු. ශ. | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| මුදල් පොතේ ශේෂය : 1972.01.01 දිනට | | 92,049 97 | | | |
| ආදායම් : | | | වියදම් : | | |
| ඒ.—සාමාන්‍ය ආදායම ... ... | 92,009 01 | | ඒ.—සාමාන්‍ය වියදම ... ... | 55,688 78 | |
| සී.—සභාවට අයත් ගොඩනැගිලි සහ ඉඩම්... | 810 00 | | බී.—මංමාවත් ... ... | 9,525 33 | |
| ඩී.—මහජන සනීපාරක්ෂාව ... | 51,336 97 | | සී.—සභාවට අයත් ගොඩනැගිලි සහ ඉඩම් ... | 11,812 89 | |
| ඊ.—මහජන සාදයෝ ... ... | 6,510 50 | | ඩී.—මහජන සනීපාරක්ෂාව ... | 61,348 19 | |
| ජී.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | 6 00 | | ඊ.—මහජන සාදයෝ ... ... | 698 00 | |
| ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 644 25 | | අයි.—ගින්නෙන් ආරක්ෂාවීම ... | 77 40 | |
| | | 1,51,317 06 | ජේ.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 2,638 69 | |
| | | | | | 1,41,789 28 |
| වෙනත් ලැබීම් : | | | වෙනත් ගෙවීම් : | | |
| තැන්පත් ... ... | 87,723 37 | | තැන්පත් ... ... | 59,458 04 | |
| අත්තිකාරම් ... ... | 30,566 56 | | අත්තිකාරම් ... ... | 53,930 59 | |
| රජයේ ආධාර මුදල් ... ... | 11,312 00 | | රජයේ ආධාර මුදල් ... ... | 1,817 50 | |
| | | 1,29,601 83 | | | 1,15,206 13 |
| ස්ථිර තැන්පත් ... ... | | 52,000 00 | විදුලිබල ගිණුම ... ... | | 1,39,074 80 |
| විදුලි බල ගිණුම ... ... | | 1,60,163 95 | අධිකතා ඌනතා ගිණුම—සාමාන්‍ය ... | | 95 58 |
| ක්ෂය සංචිතය ... ... | | 2,500 00 | | | |
| අධිකතා—ඌනතා ගිණුම—සාමාන්‍ය ... | | 1,268 84 | | | |
| අධිකතා—ඌනතා ගිණුම—විදුලිය අංශය ... | | 13,565 18 | ආදායම් රැස්කිරීමේ ගිණුම් : | | |
| ආදායම් රැස්කිරීමේ ගිණුම් : | | | දේපොල බදු ... ... | 7,696 95 | |
| දේපොල බදු ... ... | 8,170 69 | | ජලබදු ... ... | 3,762 55 | |
| ජල බදු ... ... | 3,878 07 | | වැසිකිළි බදු ... ... | 3,758 08 | |
| වැසිකිළි බදු ... ... | 3,868 10 | | කුලී ... ... | 17,856 00 | |
| කුලී ... ... | 25,301 19 | | වැසිකිළි ගාස්තු ... ... | 864 00 | |
| වැසිකිළි ගාස්තු ... ... | 692 00 | | වරෙන්තු ගාස්තු ... ... | 832 14 | |
| වරෙන්තු ගාස්තු ... ... | 1,239 97 | | විදුලි ගාස්තු ... ... | 1,37,508 81 | |
| විදුලි ගාස්තු ... | 1,46,503 44 | | | | 1,72,278 53 |
| | | 1,89,653 46 | විවිධ ණය ගැතියෝ ... ... | | 29,311 06 |
| විවිධ ණය ගැතියෝ ... | | 34,816 80 | විවිධ ණය හිමියෝ ... ... | | 45,581 06 |
| විවිධ ණය හිමියෝ ... | | 35,998 38 | 1972.12.31 දිනට මුදල් පොතේ ශේෂය ... | | 2,19,598 70 |
| 1971.12.31. දිනට මුදල් පොතේ ශේෂය ... | | 92,049 97 | | | |
| | | 8,62,935 47 | | | 8,62,935 47 |

වැලිමඩ සුළු නගර සභාවේ සභාපති වැල්හේනගේ අමරියස් සිල්වා වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට වැලිමඩ සුළු නගර සභාවේ ආදායම් හා වියදම් පිළිබඳව සත්‍යවූත්, නිවැරදි වූත් ප්‍රකාශයක් බව මෙයින් සහතික කරමි.

ඩබ්ලිව්. ඒ. සිල්වා,
සභාපති,
වැලිමඩ සුළු නගර සභාව.

1973 මාර්තු මස 28 වැනි දින,
වැලිමඩ සුළු නගර සභා කාර්යාලයේ දීය.

1973 මාර්තු මස 28 වැනි දින, මා ඉදිරියේ වැලිමඩදී සහතික කරණ ලදී.
ගෝ. පී. ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාර තැන, වැලිමඩ.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.
ආර්. ඇම්. මුතුබණ්ඩා,
අංක 1 දරණ කොට්ඨාශයේ සභික.

11–306/2—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

# අය - වැය ලේඛණ

## රක්වාන සුලු නගර සභාව

### සුලු නගර සභා මුදල් රෙගුලාසි 40(1) යටතේ අනුමත කරන පළමුවන අතිරේක ඇස්තමේන්තුව

### අය වැය ලේඛණය—1973

### 1 වන කොටස—සාමාන්‍ය

| (ආ) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේනම් | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 3 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... ... | 4 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 | 0 |

11–486/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## රඹුක්කන නගරය

### 1974 වර්ෂයට වෙළඳ බලපත්‍ර ගාස්තු

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) 161 වැනි හා 163 වැනි වගන්ති යටතේ ‌රඹුක්කන නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින්, මීට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර කෙරෙන බලපත්‍ර සඳහා එකී උපලේඛනයෙහි සඳහන් බලපත්‍ර ගාස්තුව 1974 ජනවාරි 1 වෙනි දින සිට පනවා ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. සෝමතුංග,
විශේෂ කොමසාරිස්—රඹුක්කන නගරය.

1973 ඔක්තෝබර් මස 29 වෙනි දින,
රඹුක්කන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

පහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් හෝ පාවිච්චි කිරීම සඳහා බලය පවරාදෙන බලපත්‍රයකට :—

| | බලපත්‍ර විස්තර | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|
| 1. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම ... | 15 | 0 |
| 2. | බත් කඩයක් පවත්වාගෙන යාම ... ... | 30 | 0 |
| 3. | බේකරියක් පවත්වාගෙන යාම ... ... | 40 | 0 |
| 4. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම ... ... | 20 | 0 |
| 5. | කොප්පරා නිශ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කිරීම | 25 | 0 |
| 6. | ස්වර්ණාභරණ නිපදවීම ... ... | 20 | 0 |
| 7. | ගඩොල් නිපදවීම ... ... ... | 20 | 0 |
| 8. | ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම ... | 50 | 0 |
| 9 | එළුමස් වෙළඳාම ... ... ... | 25 | 0 |
| 10. | එළහරක් මස් වෙළඳාම ... ... | 25 | 0 |
| 11. | ගැලුම් පනහකට (50) වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩාකර තබා ගැනීම ... ... ... | 7 | 50 |
| 12. | ග්‍රෝස් 10කට වැඩි ප්‍රමාණයක ගිණිපෙට්ටි ගබඩාකර තබා ගැනීම ... ... ... | 10 | 0 |
| 13. | ඉඹුල්, පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම ... ... ... | 20 | 0 |
| 14. | මැතිලේටඩ් ස්ප්‍රිතු නිශ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම ... ... ... | 10 | 0 |
| 15. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිශ්පාදනය කිරීම හෝ සාදන ලද භාණ්ඩ ගබඩාකර තබා ගැනීම | 15 | 0 |
| 16. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී මෝලක් පවත්වාගෙන යාම ... ... ... | 150 | 0 |
| 17. | දව ගබඩාවක් පවත්වාගෙන යාම ... ... | 25 | 0 |
| 18. | දර ගබඩා කිරීම (i) වරකට යාර 10කට අඩු ... | 12 | 50 |
| | (ii) වරකට යාර 10කට වැඩි ... | 25 | 0 |
| 19. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හො. 15ට වැඩි කිසියම් තොගයක් ගබඩාකර තබා ගැනීම ... | 25 | 0 |
| 20. | හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම ... | 75 | 0 |
| 21. | බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම ... ... | 7 | 50 |
| 22. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| 23. | පොහොර හෝ රසායන පොහොර නිශ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම ... ... | 10 | 0 |
| 24. | හම් ගබඩාකර තබා ගැනීම ... ... | 25 | 0 |
| 25. | කුකුළන් සියයට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම... ... | 25 | 0 |
| 26. | පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 27. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුලු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම ... | 100 | 0 |
| 28. | කරවල, ලුණුමාළු හෝ ජාඩි හොණ්ඩර 3ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම ... ... | 15 | 0 |
| 29. | බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම ... | 25 | 0 |
| 30. | වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| 31. | මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපොලක් පවත්වාගෙන යාම ... ... | 35 | 0 |
| 32. | බෙලෙක් වැඩපොලක් පවත්වාගෙන යාම ... | 15 | 0 |
| 33. | කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 34. | පාස්සන ඊයම් නිපදවීම (නිශ්පාදනය කිරීම) ... | 200 | 0 |
| 35. | විදුලි කර්මාන්ත වැඩපොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපොලක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 36. | අඟුරු සඳහා දව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම ... ... ... | 20 | 0 |
| 37. | සිමෙන්ති හො. 25ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 15 | 0 |
| 38. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම ... | 20 | 0 |
| 39. | සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම... ... | 15 | 0 |
| 40. | පුන්නක්කු හො. 10ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම ... ... ... | 10 | 0 |
| 41. | සත්වාහාර හෝ කුකුල් කෑම නිශ්පාදනය කිරීම ... | 25 | 0 |
| 42. | ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම ... ... ... | 10 | 0 |
| 43. | ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 44. | මෙරට හෝ රට වේවැල් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම ... ... | 10 | 0 |

| | බලපත්‍ර විස්තර | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|
| 45. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| 46. | රස කැවිලි වර්ග නිපදවීම ... ... | 10 | 0 |
| 47. | විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 48. | ඇසිඩ වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 49. | හුණුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 50. | පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම ... | 10 | 0 |
| 51. | පින්තාරු තීන්ත, වාර්නිස් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හො. 5ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම ... | 15 | 0 |
| 52. | ලැලි සකස් කිරීම හෝ ලැලි පදම් කිරීම ... | 15 | 0 |
| 53. | කොකෝවා හෝ වියලි පැපොල්කිරි ගබඩාකර තබා ගැනීම | 15 | 0 |
| 54. | කෝපි, ධාන්‍ය වර්ග, මාෂ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම | 25 | 0 |
| 55. | යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ භෝග වර්ග කෙටීම ... | 50 | 0 |
| 56. | වයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම ... ... ... | 20 | 0 |
| 57. | පාසැල් ගල්ලැලි නිපදවීම ... ... | 10 | 0 |
| 58. | සෞඛ්‍ය තුවා නිපදවීම ... ... ... | 10 | 0 |
| 59. | ශීත කල මස් හෝ මාළු වර්ග ගබඩාකර තැබීම ... | 10 | 0 |
| 60. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| 61. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම ... ... ... | 25 | 0 |
| 62. | යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම ... ... ... | 7 | 50 |
| 63. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තැබීම ... | 50 | 0 |
| 64. | මාළු වෙළඳාම් කිරීම ... ... ... | 15 | 0 |
| 65. | බීඩි එතීම : සේවක සංඛ්‍යාව 1 සිට 5 දක්වා ... | 10 | 0 |
| | සේවක සංඛ්‍යාව 6 සිට 10 දක්වා ... | 20 | 0 |
| | සේවක සංඛ්‍යාව 10ට වැඩි ... ... | 50 | 0 |
| 66. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිශ්පාදනය කිරීම ... | 200 | 0 |
| 67. | සංචාරක මාළු වෙළඳාම ... ... | 240 | 0 |
| 68. | කුළුබඩු හෝ සිල්ලර කඩයක් පවත්වාගෙන යාම ... | 20 | 0 |
| 69. | මිණී පෙට්ටි ගබඩා කිරීම ... ... | 50 | 0 |
| 70. | කපුනූල් සායම් පෙවීම හෝ රෙදි විවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම :— | | |
| | සේවක සේවිකාවන් 10 දෙනෙකු දක්වා වැඩ කරන ස්ථානය ... ... ... | 15 | 0 |
| | සේවක සේවිකාවන් 10ට වැඩි 25ට නොවැඩි සංඛ්‍යාවක් වැඩ කරන ස්ථානය ... ... | 25 | 0 |
| | සේවක සේවිකාවන් 250ට වැඩි සංඛ්‍යාවක් වැඩ කරන ස්ථානය ... ... ... | 50 | 0 |
| 71. | එළවළු වෙළඳාම (ප්‍රසිද්ධ වෙළඳ පොලෙන් පිට) ... | 10 | 0 |
| 72. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම ... ... | 15 | 0 |
| 73. | පළතුරු වෙළඳාම ... ... ... | 10 | 0 |
| 74. | උගස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම ... | 100 | 0 |
| 75. | යකඩ බඩු ගබඩා කර තබා ගැනීම ... ... | 25 | 0 |
| 76. | සිංහල බෙහෙත් බඩු ගබඩාවක් පවත්වාගෙන යාම ... | 10 | 0 |

11–486/3—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## වැද්දුව සුළු නගර සභාව

### 1974 වර්ෂයට වරිපනම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි වගන්තිය යටතේ 1973 වර්ෂයට පණවන ලද දේපල බද්ද 1974 වර්ෂයටද එලෙසම පැණවීමට වාද්දුව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට 8 බගින් වූ දේපළ බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසන් කළ හැකි වේ.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වැද්දුව.

1973 ඔක්තෝම්බර් මස 24 වැනි දින,
වාද්දුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–326—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### 1974 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (477 වැනි අධිකාරය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පණතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර වාද්දුව සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකු වෙනුවෙන් රුපියල් 1 ක්ද, බැල්ලියක වෙනුවෙන් රු. 1.50 ක්ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1974 වර්ෂයට පනවා ඇති බවද, එකී ගාස්තු 1974 වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වාද්දුව.

1973 ඔක්තෝම්බර් මස 24 වෙනි දින,
වාද්දුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

11–325/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### 1974 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥා පණත, වාද්දුව සුළු නගර සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥා පණතේ අංක 161(1) දරණ වගන්තිය යටතේ පහත උප ලේඛණයේ විස්තර වන ගණන් අනුව 1974 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමට ද,

(2) එකී ආඥා පණතේ 162(3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

### උප ලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝද්‍රත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි කරත්ත, අත්කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝද්‍රත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝද්‍රත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝද්‍රත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කරන්නේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන්දෙන්නා බැඳි සෑම බරකරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 4 | 0 |
| තනිගොනා බැඳී සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | 2 | 0 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික්කලයක් වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 3 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... ... | 1 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 | 0 |

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
සුළු නගර සභාව, වාද්දුව.

1973 ඔක්තෝම්බර් මස 24 වෙනි දින,
වාද්දුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–326/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

### බලපිටිය උප නගරසභාව

**1974 අවුරුද්ද සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු**

**උප නගර සභා ආඥාපනත (256 පරිච්ඡේදය)**

බලපිටිය උප නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) උප නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1974 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමට ද,

(2) එකී ආඥාපනතේ 162 (3) යටතේ එකී බදු 1974.3.31 වෙනි දිනට හෝ එකී දිනට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය, උප නගර සභාව.

1973 ඔක්තෝබර් මස 20 වන දින,
බලපිටිය.
උප නගර සභා කාර්යාලයේ දී ය.

**උප ලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පා පැදි, පා පැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, හා පා පැදි හෝ රෝදත්‍රයේ පා පැදි හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පා පැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදියක් හෝ මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 3 | 0 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | 4 | 0 |
| තනි ගොනා බැඳුණු සෑම බර භාගයක් හෝ තිරික්කලයක් සඳහා | 2 | 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... ... | 2 | 50 |
| සෑම රික්ෂෝවක් සඳහා ... ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 5 | 0 |
| සෑම බූරුවෙක් සඳහා ... ... ... | 1 | 0 |

11–485/1—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### බලපිටිය සුළු නගර සභාව

**1974 වරිපනම් ලේඛණ**

1974 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති බලපිටිය සුළු නගර සභාවේ වරිපනම් ලේඛන රාජකාරි වේලාවන් තුල මෙම කාර්යාලයේ දී පරීක්ෂා කිරීම පිණිස විවෘතව ඇති බව (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණතේ 165(1) වැනි වගන්තිය යටතේ කියවෙන (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපණතේ 253(1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1973 ක්වූ ඔක්තෝබර් මස 20 වැනි දින,
බලපිටිය,
සුළු නගර සභා කාර්යාලයේ දී ය.

11–4ϐ5/2—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### බලපිටිය සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපණත**

**1974 වර්ෂයට දේපල බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණත යටතේ මෙම ගෙවී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු මෙම සුළු නගර සභා ප්‍රදේශය තුල 1974 වර්ෂයටත් එලෙසම පැනවීමට බලපිටිය සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාවතුල පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල (කුඹුරු, මුඩුබිම් හැර) වාර්ෂික වටිනා කමින් සියයට හය බැගින් වූ වාර්ෂික බද්දක් පිළිවෙලින් ජූනි 30 සහ දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන අයුරු අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු වේ.

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
සුළු නගර සභාව බලපිටිය.

1973 ඔක්තෝබර් මස 20 වැනි දින,
බලපිටිය,
සුළු නගර සභා කාර්යාලයේ දී ය.

11–485/3—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

(261 වැනි අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි හා 4 වැනි වගන්ති යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පිළියෙල කරන ලදුව, එම පනතේ 2 වැනි වගන්තියේ ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත්කරන ලද මෙහි පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට නාරම්මල සුළු නගර සභා ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමටත්, 1973 අගෝස්තු මස 24 වැනි දින අංක 3 (5) දරණ සභා සම්මුතිය යටතේ නාරම්මල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ඇස්. ඇම්. ජී. කේ. සුබසිංහ,
සභාපති,
නාරම්මල සුළු නගර සභාව.

1973 අගෝස්තු මස 28 වැනි දින,
නාරම්මල සුළු නගර සභා කාර්යාලයේ දී.

**අතුරු ව්‍යවස්ථාව**

කලින් කල සංශෝධනය කරන ලද පරිදිවූ 1953 නොවැම්බර් මස 6 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහිවූ උප ලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටස හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ,": තවද,

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

**උපලේඛනය**

**I වැනි කොටස**

**අන්ත්‍රාදායක ව්‍යාපාර**

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ෂණය.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම.

පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.

තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.

කුළියටදීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මාෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.

දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
හිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ශෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පළක් පවත්වාගෙන යෑම.
අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල්කටු ගබඩා කර තබා ගැනීම.

ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
සිල්ක් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

## II වැනි කොටස

### අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩා කර තබා ගැනීම.

උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.
කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.

රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, ජාඩි හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.

පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැස්වීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මඤ්ඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.

ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ට්‍රන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.

ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහභාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පලතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල්ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ෂණය කිරීම.

දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රූ එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

හුණුගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිප්ටෙම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

සෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
පලතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂබෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.
බේකිං පවුඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ සුයර නිපදවීම.
පාසල් රටහුණු නිපදවීම.
ටයර් කට්ට කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසැල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවා කඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.

ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තැබීම.
කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු (වයිට්ටිං) හුණු හෝ හිරියල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිණිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
ඩයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

| | බලපත්‍ර විස්තර | වාර්ෂික ගාස්තුව රු. | ශ. |
|---|---|---|---|
| 157. | මදුරුකව (කොයිල්) නිපදවීම ... ... | 15 | 0 |
| 158. | ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම ... ... | 15 | 0 |
| 159. | රබර් ද්‍රව්‍ය හෝ රබර් සිමෙන්ති නිපදවීම ... | 20 | 0 |
| 160. | ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම ... | 20 | 0 |
| 161. | වීදුරු භාණ්ඩ නිපදවීම ... ... | 25 | 0 |
| 162. | වීදුරු කැඩපත් නිපදවීම ... ... | 25 | 0 |
| 163. | යකඩ තහඩු ගැල්වනයිස් කිරීම ... ... | 20 | 0 |
| 164. | පාස්සන ඊයම් නිපදවීම ... ... | 20 | 0 |
| 165. | ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම ... ... | 20 | 0 |
| 166. | කටු කම්බි නිපදවීම ... ... ... | 20 | 0 |
| 167. | කම්බි ඇන නිපදවීම ... ... | 20 | 0 |
| 168. | කාබන් කඩදසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම | 20 | 0 |
| 169. | බෙලෙක් පතුරු, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම | 25 | 0 |
| 170. | වී. අයි. බාල්දි නිපදවීම ... ... | 20 | 0 |
| 171. | වායු සමන යන්ත්‍ර ශීතකරන හෝ අධිශීත කරන (ඩීප් ෆ්‍රි සර්) නිපදවීම, සර්විස්කිරීම හෝ අළුත්වැඩියා කිරීම ... | 75 | 0 |
| 172. | බ්‍රෙක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම ... | 75 | 0 |
| 173. | යන්ත්‍ර උපකරන නිපදවීම ... ... | 100 | 0 |
| 174. | විදුලි භාණ්ඩ නිපදවීම ... ... | 50 | 0 |
| 175. | රබර් කැවුන කෙඳිවර්ග නිපදවීම ... ... | 15 | 0 |
| 176. | සමවයන බැටරි නිපදවීම ... ... | 15 | 0 |
| 177. | වියළි කෝෂ බැටරි නිපදවීම ... ... | 15 | 0 |
| 178. | ඊයම් බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 25 | 0 |
| 179. | රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 25 | 0 |
| 180. | ට්‍රැක්ටර් රථ එකලස් කිරීම ... ... | 100 | 0 |
| 181. | රේඩියේටර් නිපදවීම ... ... | 50 | 0 |
| 182. | විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරන වැඩපලක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| 183. | ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම | 250 | 0 |
| 184. | සබන් ගබඩා කිරීම ... ... | 10 | 0 |
| 185. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... | 250 | 0 |
| 186. | කපු නූල් සායම් පෙවීම හා නිම කිරීම ... | 25 | 0 |
| 187. | ලියනපට්ටලයක් පාවිච්චි කරන සථානයක් පවත්වාගෙන යාම ... ... ... | 200 | 0 |
| 188. | අයිස් ක්‍රීම් හෝ සරුවත් සෑදීම ... ... | 10 | 0 |
| 189. | ද්‍රව ග්ලූකෝස් නිපදවීම ... ... | 15 | 0 |
| 190. | පළතුරු වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 25 | 0 |
| 191. | එළවළු වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| 192. | බේකරියක් පවත්වාගෙන යාම ... ... | 65 | 0 |
| 193. | බත් කඩයක් පවත්වාගෙන යාම ... ... | 25 | 0 |
| 194. | හෝටලයක් පවත්වාගෙන යාම ... ... | 25 | 0 |
| 195. | ලැගුම්හලක් පවත්වාගෙන යාම ... ... | 30 | 0 |
| 196. | රෙස්ටුරන්ස් ශාලාවක් පවත්වාගෙන යාම ... | 210 | 0 |
| 197. | තේ කඩයක් පවත්වාගෙන යාම ... ... | 20 | 0 |
| 198. | කෝපි කඩයක් පවත්වාගෙන යාම ... ... | 10 | 0 |
| 199. | මස් විකිණීමේ කඩයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 250 | 0 |
| 200. | මාළු විකිණීමේ කඩයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 50 | 0 |
| 201. | බාබර් සාප්පුවක් හෝ හිසකෙස් කපන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 30 | 0 |
| 202. | සිල්ලර වශයෙන් විකිණීම පිණිස ආහාර ද්‍රව්‍ය තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ... | 75 | 0 |
| 203. | වෙළඳපොලක් පවත්වාගෙන යාම ... ... | 250 | 0 |
| 204. | මිනී පෙට්ටි සෑදීම හා ගබඩා කිරීම ... ... | 50 | 0 |
| 205. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම ... | | |
| | (i) එළදෙනුන් 2–5 දක්වා වූ විට ... ... | 10 | 0 |
| | (ii) එළදෙනුන් 6–10 දක්වා වූ විට ... | 25 | 0 |
| | (iii) එළදෙනුන් 11–25 දක්වා වූ විට ... | 50 | 0 |
| | (iv) දෙනුන් 26 සිට ඉහළට ... ... | 100 | 0 |
| 206. | මාළු බයිසිකලයක් තබා ගැනීම ... ... | 2 | 50 |
| 207. | වෙළඳ සීමාව තුල වාහනයක් (බයිසිකලයෙන් හැර) යොදා මාළු විකිණීම ... ... | 25 | 0 |
| 208. | පදික වෙළෙන්දෙකුගෙන් ... ... | 2 | 50 |
| 209. | පපඩම් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| 210. | පුන්නක්කු හෝ සත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 100 | 0 |
| 211. | සතුන් මරණ ස්ථානයක් පවත්වාගෙන යාම ... | 100 | 0 |
| 212. | කුකුල්, තාරා ආදි පක්ෂීන් විකිණීම සඳහා ස්ථානයක් තබා ගැනීම ... ... ... | 25 | 0 |
| 213. | ගඩොල් හෝ උළු පෝරණුවක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| 214. | ගිණි පෙට්ටි ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| 215. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම ... | 15 | 0 |
| 216. | විකිණීම සඳහා කරවල තොගක් ගබඩා කර තබා ගැනීම | 50 | 0 |
| 217. | පරණ යකඩ විකිණීම සඳහා ගබඩා කිරීම ... | 125 | 0 |
| 218. | අළුත් යකඩ විකිණීම සඳහා ගබඩා කිරීම ... | 125 | 0 |
| 219. | වෙඩි බෙහෙත් විකිණීම සඳහා ගබඩා කිරීම ... | 125 | 0 |
| 220 | සිමෙන්ති වෙළඳාම් කිරීම ... ... | 100 | 0 |
| 221. | ගාලක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| 222. | බීඩි නිෂ්පාදනය ... ... ... | 50 | 0 |
| 223. | පින්තූර රාමු කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 25 | 0 |

11–332—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

**මොණරාගල දිස්ත්‍රික්කයේ කඳුකර ගම් ප්‍රදේශය**

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත**

මෙහි පහත විස්තර දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කර ඇති ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1974 වර්ෂය වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනීමට අයදුම් පතක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් කඳුකර ගම් ප්‍රදේශය තුළ පදිංචි කිසිවෙකු විරුද්ධ වන්නේ නම් ඒ කුමන කාරණයක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

**උපලේඛණය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම් කරන ස්ථානය හා ස්වභාවය | ඝාතනය කරන ස්ථානය |
|---|---|---|
| එම්. සී. එම්. සිද්දික්, අළුපොත ටවුම, බඩල්කුඹුර ... | ... අළුපොත හා බඩල්කුඹුර, " එළ හරක් මස් " | අළුපොත |

ටී. බී. වර්සකෝන්,
පාලන නිළධාරි, කඳුකර ගම් ප්‍රදේශය.

1973 ඔක්තෝබර් 24 දින,
බඩල්කුඹුර,
පාලන නිළධාරි කාර්යාලයේදී ය.

11–250—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

### පරගොඩ ගම්සභාව

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත) 261 වැනි අධිකාරිය**

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ පරගොඩ ගම් සභාව විසින් සම්මත කරගෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරන ලද බව 1953 අගෝස්තු මස 07 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, (අංක 1 සහ 37 කාණ්ඩ දෙකම ඇතුළත්ව)

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 08 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩයද,

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 08 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරනු ලැබ 1969 ජනවාරි මස 03 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39 සිට 41 දක්වා වූ කාණ්ඩද (අංක 39 සහ 41 වැනි කාණ්ඩ දෙකම ඇතුළත්ව) මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට ගාලු දිස්ත්‍රික්කයේ පරගොඩ ගම් සභාව විසින් පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 261 වැනි පරිච්ඡේදයේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

දී. ග. ශු. ගුණපාල,
පරගොඩ ගම්සභාවේ සභාපති.

පරගොඩ ගම්සභා කාර්යාලය,
ඉමදුව.
1973. 10. 23 දින දීය.

11–238—73 11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### උඩප්පු ගම් සභාව

**1952 අංක 6 දරණ ප්‍රාදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත**

ප්‍රදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ උඩප්පු ගම්සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර පල කර සිටිනු ලැබේ.

**යෝජනාව**

ප්‍රදේශීය බල මණ්ඩල පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ උඩප්පු ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් මෙම යෝජනාව ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පලවන දින සිට ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි සම්මත කරනු ලැබේ.

පළාත් පාලන ගරු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1972 නොවැම්බර් මස 3 වන දින අංක 32 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද්දාවද ජාතික රාජ්‍ය සභාවේ යෝජනාවකින් 1973 අප්‍රේල් මස 5 වැනි දින අනුමත කරන ලද බව 1973 ජූනි මස 29 වැනි දින අංක 66 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 42 වැනි කාණ්ඩය මෙම යෝජනාව ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට හලාවත දිස්ත්‍රික්කයේ උඩප්පු ගම් සභාව විසින් 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

පී. කන්දසාමි,
සභාපති,
උඩප්පු ගම් සභාව.

1973 සැප්තැම්බර් මස 15 වැනි දින,
උඩප්පු ගම්සභා කාර්යාලයේ දිය,
උඩප්පුව.

11–254—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

**1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (සම්මත අතුරු ව්‍යවස්ථා) ආඥා පණත**

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (සම්මත අතුරු ව්‍යවස්ථා) ආඥා පණතේ 3 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පලකරනු ලැබේ :—

**යෝජනාව**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1972 ජනවාරි මස 7 වැනි දින ආතමින් (261 වන අධිකාරය) වන ප්‍රදේශාධිකාරී සභා (පොදු සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ 2 වැනි වගන්තිය ප්‍රකාර අංක 15,001 දරණ 1972 මාර්තු මස 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ප්‍රකාශයට පත්කරන ලද කලින් සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල xviii වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල සංශෝධිත අතුරු ව්‍යවස්ථා සම්පූර්ණයෙන් මේ යෝජනාව ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට හලාවත දිස්ත්‍රික්කයේ මැද පළාත ගම්සභාව විසින් 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඒරන් අබේකෝන්,
සභාපති,
මැද පළාත ගම්සභාව.

1973 ඔක්තෝබර් මස 30 වැනි දින,
මැද පළාත ගම්සභා කාර්යාලයේ දීය,
තබ්බෝව, නාත්තන්ඩිය.

11–266—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

### බිබිල ගම සභාව (මොණරාගල දිස්ත්‍රික්කය)

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත**

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කොට ඇති ස්ථානයේ 1974 වර්ෂය සඳහා මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කොට තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍රයක් නිකුත් කිරීම ගැන බිබිල ගම්සභා ප්‍රදේශයේ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින දහතරක් (14) ඇතුලත දී මා වෙත ඉදිරිපත් කලයුතු බව මෙයින් දනුම් දෙමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| 1. ඒ. එල්. ඒ. හමීද් | කණුල්වල, බිබිල | එළහරක් මස් වෙළඳාම | කණුල්වල, කෝන්ගහ වත්ත |

පු. හේ. අමරපාල,
බිබිල ගම්සභාපති.

73.10.23 දින,
බිබිල ගම්සභා කාර්යාලයේ දීය.

11–278—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

### අටුලුගම ගම් සභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණත

මෙහි පහත උපලේඛණයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1974 වර්ෂයට ගව මස් කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින් මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන අටුලුගම ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගෙන් විරුද්ධත්වයක් ඇත්නම්, එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යැයි සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳමේ ස්වභාවය | පිහිටි ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ඇල්. සවුරාඋම්මා, නො. 140, ගරාගොඩ, යටියන්තොට ... | ... ගව මස් වෙළඳාම | ... පරණ දුම්රියපල ඉඩම, ගරාගොඩ |
| 2. ඇම්. ඇම්. ෂරිප්දින්, 359/1, තල්දූව, අවිස්සාවේල්ල ... | ... ගව මස් වෙළඳාම | ... කාප්ප කඩේ වත්ත, නාපාවල |

පී. වී. පොඩිනිලමේ ගරාගොඩ,
අටුලුගම ගම්සභාවේ සභාපතිතැන.

අටුලුගම ගම්සභා කාර්යාලය,
දෙහිඕවිට,
1973 ඔක්තෝබර් මස 26 වැනි දින.

11–298—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

---

### යටිනුවර මැදපලාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය ඊට ඉදිරියේ සඳහන් ස්ථානයන්හි, 1974 වර්ෂය තුල එළහරක් මස් කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර අයදුම් කර ඇත. එම බලපත්‍ර නිකුත් කිරීම ගැන යටිනුවර මැදපලාත ගම් ප්‍රදේශය තුල පදිංචි යම් කිසිවෙකු විරුද්ධවන්නේ නම්, ඒ බව කරුණු සහිතව පිටපත් දෙකකින් යුක් ලිඛිත ප්‍රකාශනයකින් මෙම දන්වම ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට සති දෙකක් ඇතුලත මා වෙත ඉදිරිපත් කල යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272) අධිකාරියේ 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|
| ඒ. ඇම්. හංසිම්, දෙහිඅංග, මුරුත්තලාව ... | ... ඉඑක්වක්කේ මඩරන්ගොඩ වත්ත | ... එළහරක් මස් කඩය |
| වී. ඕ. ඇල්. ඇම්. ඉබ්‍රාහිම්, දෙහිඅංග, මුරුත්තලාව ... | ... දෙහිඅංග ... | ... එළහරක් මස් කඩය |
| ඇම්. අබ්දුල්, මුත්තලිප්, මුංවතුගොඩ, දන්තුරේ ... | ... මුංවතුගොඩ ... | ... එළහරක් මස් කඩය |
| ඒ. ඇල්. ඇම්. රවුප්, දෙහිගම, 104/ඒ, මුරුත්තලාව ... | ... දෙහිඅංග ... | ... එළහරක් මස් කඩය |

ජී. ලේන්හුවා,
සභාපති,
යටිනුවර මැදපලාත ගම්සභාව.

1973 ක්වූ ඔක්තෝබර් මස 20 වැනි දින,
ගම්සභා කාර්යාලය,
ඇඹිල්මීගම, පිළිමතලාව.

11–307—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය.

---

### හාරිස්පත්තුව උඩගම්පහ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන නම් සඳහන් අය විසින්, ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය 1974 වර්ෂය සඳහා නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව උඩගම්පහ ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දහ හතරක් (14) ඇතුළතදී මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇන්. අබ්දුල් කාදර්, අකුරණ ... | ... එළ හරක් මස් ... | ... මාතලේ පාර, අංක 195 දරණ ස්ථානයේ |
| 2. ඇන්. අබ්දුල් කාදර්, අකුරණ ... | ... එළ මස් ... | ... මාතලේ පාර, අංක 191/ඒ දරණ ස්ථානයේ |

ඒ. ඇම්. අමරසිංහ,
සභාපති,
හා. ප. උඩගම්පහ ගම්සභාව.

හා. ප. උඩගම්පහ ගම්සභාව,
අලවතුගොඩ,
1973 ඔක්තෝබර් මස 26 වැනි දින.

11–308—73.11.09 දින අංක 85 දරන ගැසට් පත්‍රය

## කොස්ලන්ද ගම්සභාව—බදුල්ල දිස්ත්‍රික්කය

### ගෝඝාතක ආඥා පනත

මෙහි පහත උප ලේඛණයේ නම් සඳහන් අය එහි සඳහන් කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1974 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බල පත්‍රයක් නිකුත් කිරීම ගැන කොස්ලන්ද ගම්සභා ප්‍රදේශය තුල පදිංචි අයෙක් හෝ සංවිධානයක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතුව සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත දන්වා එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි පරිච්ඡේදයේ) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛණය

| අයදුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ජේසුදාසන්, 97, හපුතලේ පාර, කොස්ලන්ද ... | හරක් මස් සහ එළු මස් ... | කොස්ලන්ද-හපුතලේ පාරේ අංක 97 දරන ස්ථානය |

ටී. අයි. කමල්දීන්,
පරිපාලන නිලධාරිතැන,
කොස්ලන්ද ගම්සභා ප්‍රදේශය.

1973.10.30, කොස්ලන්ද.

11–484—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## උතුරු උලගල්ල කෝරලේ ගම්සභාව

### ගෝඝාතන ආඥා පනත

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1974 වර්ෂයේ මස් වෙළඳාම කරගන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතන ආඥාපනතේ (272 වන පරිච්ජේදයේ) 7 (2) වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ. මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන උතුරු උලගල්ල කෝරලේ ගම්සභා සීමාව තුල පදිංචි යම්කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඒ කුමන කරුණු මත දැයි දක්වෙන අනුපිටපත කින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ දැන්වීම පලවූ දින සිට දහා හතර (14) දවසක් ඇතුලත මා වෙත එවිය යුතුබව මෙයින් දන්වමි.

#### උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. සුලෙයිමාන්, නාච්චදුව, හිදෝගම ... ... ... | හරක් මස් වෙළඳාම ... | නාච්චාදුව |

යූ. බී. ඉලංගසිංහ,
උතුරු උලගල්ල කෝරලේ ගම්සභාපති.

1973 ඔක්තෝබර් මස 30 වැනි දින,
තිරප්පනේ ගම්සභා කාර්යාලයේ දී ය.

11–483—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

---

## ගොළුවාමුල්ල-ඕමත්ත ගම්සභාව

### ප්‍රාදේශිය බල මණ්ඩලය (සම්මත අතුරු ව්‍යවස්ථා පනත)

2–887–1973 පෙබරවාරි මස 23 වැනි දින අංක 48 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයේ යෝජනාව යටතේ සඳහන්ව ඇති " XIII කොටස " යන්න " XLII කොටස " යනුවෙන් මෙයින් නිවැරදි කරමි.

සූරසේන කහවෙව්තාන,
සභාපති,
ගොළුවාමුල්ල-ඕමත්ත ගම්සභා.

1973 ඔක්තෝබර් මස 26 දින,
ගණේගොඩ,
ගොළුවාමුල්ල-ඕමත්ත ගම්සභා කාර්යාලයේ දිය.

11–482—73.11.09 දින අංක 85 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නොවැම්බර් | .. | 02.11.73 | සිකුරාද | ... | 26.10.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 09.11.73 | සිකුරාද | ... | 02.11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 16.11.73 | සිකුරාද | ... | 09 11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 23.11.73 | සිකුරාද | ... | 16 11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 30.11.73 | සිකුරාද | ... | 23 11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 07.12.73 | සිකුරාද | ... | 30 11.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 14.12.73 | සිකුරාද | ... | 07.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 21.12.73 | සිකුරාද | ... | 14.12.73 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 28.12.73 | සිකුරාද | ... | 21.12.73 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව. කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.